ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1989 අංක 1 දරන
# සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (සන්තකය සහ පාලනය දැරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 අප්‍රේල් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1989 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1989 අංක 1 දරන සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (සන්තකය සහ පාලනය දැරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1989 අප්‍රේල් මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 16/89

**සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරයේ සන්තකය සහ පාලනය ආණ්ඩුව විසින් දරනු ලැබීම, තවත් එක් අවුරුද්දක කාලසීමාවක් සඳහා පවත්වා ගෙන යාම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලබන සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාරයේ සන්තකය සහ පාලනය, ඒ ව්‍යාපාරය මගින් සලසනු ලබන සේවාවන් අඩාලවීම සහ කාර්මික වියවුල් හේතු කොට ගෙන, මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින්, මාස තුනක කාලයක් සඳහා ආණ්ඩුව විසින් අත් කර ගන්නා ලද හෙයින් ද:

ජාතික ආර්ථිකයට සම්බන්ධ වූ ද, ජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ ද, එම ව්‍යාපාරය විසින් සලසනු ලබන සේවාවන් පවත්වා ගෙන යන බවට සහතික වීමේ කාර්යය සඳහාත් එම ව්‍යාපාරයේ සේවා නියුක්තයන්ගේ අයිතිවාසිකම් යථා පරිදි පිළිගන්නා බවට සහ ඒවාට ගරු කරන බවට සහතික වීමේ කාර්යය සඳහාත්, එම වෙළෙඳ ව්‍යාපාරය පරිපාලනය කිරීම සහ පාලනය කිරීම තවත් එක් අවුරුද්දක් භාර ගෙන යාමට ආණ්ඩුවට අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1989 අංක 1 දරන සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් (සන්තකය සහ පාලනය දැරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද නියෝග මගින් සන්තකය සහ පාලනය ආණ්ඩුව විසින් භාර ගනු ලැබ ඇති, මෙම පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිත වෙළෙඳ ව්‍යාපාරය, මෙම පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් ඉක්බිතිව ම, (මෙහි මින් මතු "නිශ්චිත කාල සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවුරුදු එකක කාල සීමාවක් සඳහා තවදුරටත් ආණ්ඩුව භාරයේ සහ සන්තකයේ තිබිය යුතු ය. *වෙළෙඳ ව්‍යාපාරය අවුරුද්දක කාලසීමාවක් සඳහා ආණ්ඩුව භාරයේ සහ සන්තකයේ තවදුරටත් තිබිය යුතු බව.*

3. (1) මේ පනතේ කාර්ය සඳහා නිසි බලධරයෙකු පත් කරනු ලැබිය යුතු ය. *නිසි බලධරයා.*

(2) නිශ්චිත කාලසීමාව තුළදී, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති වෙළෙඳ ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, ඒ වෙළෙඳ ව්‍යාපාරය අයත් සමාගම වෙනුවෙන් නිසි බලධරයා විසින් කරනු ලැබිය යුතු අතර, තත් කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විධාන, නිසි බලධරයා විසින් දෙනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ බල තල ක්‍රියාත්මක කිරීමේ දී, නිසි බලධරයා, එම වෙළෙඳ ව්‍යාපාරය විසින් සපයනු ලබන සේවා පවත්වා ගෙන යාමේ සහ ඒ වෙළෙඳ ව්‍යාපාරයේ සේවා නියුක්තයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව සලකා අමාත්‍යවරයා විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි පොදු සහ විශේෂ විධානවලට යටත් විය යුතු ය.

දෙවන උපලේඛනයෙහි සඳහන් දේපළවල සන්තකය සහ පාලනය නිසි බලධරයා විසින් අත්කර ගත යුතු බව.

4. (1) මේ පනතේ පළමු වන උපලේඛනයෙහි නිශ්චය කොට දැක්වෙන වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චය කොට දැක්වෙන සියලු දේපළවල සන්තකය සහ පාලනය නිශ්චිත කාලසීමාව තුළදී නිසි බලධරයා විසින් භාර ගත යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයෙහි නිශ්චිත යම් දේපළක සන්තකය නිසි බලධරයා වෙත භාරදීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ (1) වන උපවගන්තියෙහි සඳහන් දේපළ සන්තකයට ගැනීමේ දී නිසි බලධරයා වළක්වන්නා වූ හෝ ඔහුට බාධා කරන්නා වූ හෝ යම් තැනැත්තකු ලවා වැළක්වීමට නැතහොත් බාධා කිරීමට සලස්වන්නා වූ හෝ මේ පනත යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී නිසි බලධරයාට අවහිර කරන්නා වූ හෝ බාධා කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

නිසි බලධරයා විසින් වෙළඳ ව්‍යාපාරයේ දේපළ පරිහරණය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ කරනු ලැබිය හැකි බව.

5. නිශ්චිත කාලසීමාව තුළ දී නිසි බලධරයා විසින් මෙහි පළමු වන උපලේඛනයෙහි දක්වා ඇති වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගනු ලබන මෙහි දෙවන උපලේඛනයෙහි දක්වා ඇති කිසියම් දේපළක්, එම ව්‍යාපාරය විසින් සලසනු ලබන සේවාවන් පවත්වාගෙන යාමේ කාර්ය සඳහා සහ අවස්ථාවෝචිත යයි ඔහු කල්පනා කරන ආකාරයට ද, එම ව්‍යාපාරයේ සේවා නියුක්තයන්ගේ අයිතිවාසිකම් යථා පරිදි පිළිගැනීම සහ ඒවාට ගරු කිරීම සහතික කිරීමේ කාර්ය සඳහා ද, පරිහරණය කිරීම හෝ ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම නැතහොත් පරිපාලනය කිරීමට හෝ ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අවසර දීම හෝ කරනු ලැබිය හැකි ය.

වන්දි.

6. (1) මේ පනත යටතේ නිශ්චිත කාලසීමාව සඳහා සන්තකය සහ පාලනය ආණ්ඩුව විසින් අත්කර ගන්නා ලද ව්‍යාපාරය අයත සමාගමට, එම සන්තකය සහ පාලනය වෙනුවෙන් සාධාරණ වන්දි ලැබීමේ අයිතිය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් වන්දිය තක්සේරු කිරීම සහ එම ව්‍යාපාරය අයිති සමාගමට වන්දි ගෙවිය යුතු ක්‍රමය සහ ආකාරය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

7. (1) නියෝග සෑදීමට මේ පනතෙන් නියමිත හෝ බලය දී ඇති නැතහොත් නියම කළ යුතු මේ පනතෙන් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගවල නිශ්චය කොට නියම කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන්නේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල සහ දෙමල භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත් විය යුතු බව.

## පළමුවන උපලේඛනය (2 වන වගන්තිය)

ආහාර, පාන වර්ග සහ කිරි නිෂ්පාදන නිපදවීමේ හා අලෙවි කිරීමේ කාර්යය සඳහා, සීමාසහිත සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් යන නමින් හැඳින්වෙන්නා වූ ද ස්වකීය ලියාපදිංචි කාර්යාලය, කොළඹ 02, එලිෆන්ට් හවුස් හි ඇත්තා වූ ද සමාගම විසින් කරගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාරය.

## දෙවන උපලේඛනය (4 වන වගන්තිය)

ඉඩම් සහ ගොඩනැගිලි ඇතුළුව, මේ නියෝගය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ පළමුවන උපලේඛනයේ නිශ්චිත ව සඳහන් වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යය සඳහා පරිහරණය කරනු ලැබූ සියලු නිශ්චල දේපළ, එම දිනයේදී එම වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යය සඳහා පරිහරණය කරනු ලැබූ සියලු පිරියත්, යන්ත්‍ර උපකරණ සහ සවි කිරීම් සහ එම දිනයේ දී එම වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යය සඳහා පරිහරණය කරනු ලැබූ වාහන ඇතුළු සියලු චංචල දේපළ